# අපේ ළමා අපේ හපන්කම්.

''අපූරු ගායනාව ...'' ඉසුරු පුතා ''ගී දැහැන'' ගායන කවයේ කියපු සින්දු දෙක අහලා පන්හිඳට ඉබේම කියවුණා.

''මේ වාගේ තරුණ දරුවෝ අපේ දේවල්වලට සම්බන්ධ වෙන එක මොන තරම් හොඳ ද ? දෙක ම හොඳ සිංහල සින්දු....''

පින්සල හයියෙන් අප්පුඩි ගහන ගමන් කිව්වා.

''සිංහලෙන් ලියපු කොල බලාගෙනයි කිව්වෙ....'' පැන්සල ''විසිල්'' පාරක් ගැහුවා.

''ගී දැහැන'' කියන්නේ අපේ අය එකතු වෙලා සින්දු කියන කවයක්. මාසයකට වතාවක් මේ කට්ටිය එකතු වෙලා ජයන්ත සමරක්කොඩි මහත්තයා වාදනය කරන සංගීත හඬ තීරුවලට සින්දු කියනවා. සින්දු සිය ගණනක හඬ තීරුයි, වචනයි ඒ දේවල්වලට සම්බන්ධ වෙන එක. මෙහෙ ඉපදිලා හැදුන අය සිංහල දේවල කරන්න උනන්දු වෙන එක මොන සතුටක් ද ?

''ඉංග්‍රීසි පරිසරයක හැදෙන වැඩෙන මේ අය තවත් භාෂාවක් දැනගෙන ඉන්න එක හරි වැදගත් ඒ භාෂාවෙන් අමතර දේ කරන එක තවත් වැදගත්. තරුණ වයසට එනකොට මේ අය මේ දේවල් අත අරිනවා. සමහර විට ඉගෙන ගන්න වැඩ නිසා. ඊට පස්සෙ රස්සාවල් නිසා. විශේෂයෙන් ම පිරිමි දරුවෝ.

''ඉසුරු පුතා මේ පාර වී.සී.ඊ. විභාගයට පෙනී ඉන්න දරුවෙක්. කෙනෙක් තමන්ගෙ ඉගෙන ගන්න දේට අමතරව කලාවක්, ක්‍රීඩාවක් වාගෙ දෙයක් කරන එකෙන් ඒ අයට මොහොතකට හරි අස්වැසිල්ලක් ලැබෙනවා අර ඉගෙන ගන්න මානසිකත්වයට විවේකයක් දෙන්න. ඒ වෙනස නිසා ලැබෙන විවේකය ආයෙමත් ඉගෙන ගන්න දේට අවධානය යොමු වෙන්න නව පණක් දෙනවා. ඒ වගේම හිතේ එකඟතාවය වැඩි දියුණු කරගන්න අවශ්‍ය ශක්තිය වැඩි දියුණු මහීෂ ගමගේ, ධනූෂ මල්ලිලාත් එක්ක සින්දු කියන්න අරුණ ශාන්ත මහත්තයාගේ ''ආරාධනා කවයට ආවා මතකයි. එතෙන්ට ආව සෙනුරියි සස්මියි අක්ක නගෝ දෙන්නා නම් නැටුම්වලටත් දක්ෂයි; නිවේදනයටත් දක්ෂයි''.

''අපිට අමතක කරන්න පුළුවන් ද අපූරුවට ජන ගී ගායනා කරන සුධාරක ද සිල්වා දරුවාව'' රඟපෑමටත් දක්ෂයි නේ. නැටුම්, රඟපෑම් ගැන කතා කරනකොට නම් අපිට හොඳ දරුවන් පරපුරක් බිහිවෙනවා කියල හිතන්න පුළුවන්. මොකද නැටුම්, රඟපෑම් වගේ දේවල් පුහුණු කරනව වැඩිහිටි පිරිසක් අපි අතර ඉන්න නිසා. සංගීතය උගන්වන අයත් කීප දෙනෙක් හරි ඉන්නවා''.

''සංගීතය කියන්නෙ ගායනය විතරක්ම නෙවි''. ''ගී දැහැනට ඇවිත් හැමදාම වයලීන් එක වාදයන කරන සිළුන බාලසූරිය පුතාව දැක්කම මතක් වෙන තව දරුවො ටිකක් ඉන්නවා. අදටත් සංගීත ප්‍රසංග වේදිකාවල ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ ගීතවලට වයලින් එකෙන් දායක වෙන නවීන් ගුගුලවිට පුතා හොඳ දක්ෂයෙක් කාලයකට උඩදී නවීන් එක්ක බටනලා වාදනය කරපු වීණා කෑඳරගම, ඕගන් එක වාදයන කරපු දිලිනි ප්‍රනාන්දු වගේ අය අමතක කරන්නෙ කොහොමද ? අපි අර කලින් කියපු මහේෂා ජයකොඩි දුව ''යුකුලෙලේ'' භාණ්ඩය වාදනයටත් දක්ෂයි. දවසක් ''මියුරු සරේ'' ඒ දුව සින්දු කිව්වෙ යුකුලෙලේ එක වාදනය කරන ගමන්. මහීෂ ගමගේ පුතාත් බාල මල්ලීත් සංගීත භාණ්ඩ වාදනය කරන්න දක්ෂ අය''.

තුන්දෙනා මේ කතා කරන්නේ අපේ දෙවෙනි පරම්පරාවේ අයගෙ දක්ෂකම් ගැන. ඇත්තටම අපේ උදවිය දක්ෂයි. ඒ හන්දා ඒ උදවියගේ දරුවොත් ඒ වගේ වෙන එක අහන්න දෙයක් නෑ. ඒත් හැමෝටම දරුමල්ලන්ගේ දේවල් ඉස්මතුකරගෙන ඉස්සරහට යන්න අමාරුයි. ලංකාවෙදි නම් තියෙන්නෙ තරඟයක්. වැඩිමනක්ම ඉගෙනගැනිල්ලට. ඒ තරඟයට වැදිලා ඉන්න දෙමම්පියන්ටත්, දරුවන්ටත් බාහිර දෙයක් කරන්න වෙලාවක් ඉතුරු වෙයිද ?

කීයෙන් කී දෙනෙක් ද ඉස්සරහට එන්නෙ ඇත්තට ම ?

''මේ රටේ නම් එක විදියකට අපේ දෙයක් කරගන්න පරිසරය හැදිලා තියෙනවා. තරමකට හරි වික්ටෝරියාවේ නම් විශ්ව විද්‍යාලවලට තෝරාගන්න වී.සී.ඊ. විභාගයටත් සිංහල භාෂාව ඉල්ලලා පෙනී සිටින්න පුළුවන්. අපේ අයගෙ සිංහල භාෂා පාසැල් තියෙනවා පන්සල් වල දහම් පාසල් තියෙනවා. මේ තැන්වල බාහිර දේ හැටියට අපේ කලාව කරන්න ඉඩ කඩ ලබලා දෙනවා. ජන් කියාගෙන යනවා.

''ඔබ දේවල් එක්ක වෙලාව කළමණාකරණය කරගන්න එක තමයි දෙමව්පියන්ටත්, දරුවන්ටත් තියෙන අභියෝගය. දෙමව්පියෝ රසසාවල් එක්ක කරගෙන ලොකු අරගලයක්. දරුවෝ තමන්ගේ ඉගෙන ගන්න වැඩ ගැනත් හිතන්න වෙනවා''. පැන් උත්තර බැන්දා.

''මේ වාගේ අරගල මැද්දේ අපේ හැදුන වැඩුන ළමයි අපි අතරේ මේ රටේ ඉපදිලා හැදුන වැඩුන ළමයි කරන දේවල් වලට මුල් තැන දෙන එක හරි වැදගත්. ඒ අයට දිරිමත් කරන එක අපේ යුතුකමක්. ඒ වගේම සමාජ වගකීමක්. සිංහලෙන් කතාකරන, කියවන, ලියන ළමයෙක් ගැන අපට වටින්නෙ නැත්නම් කාටද වටින්නෙ ? ඒ වටිනාකම අඳුනාගන්න එකත් හරි වැදගත්''. පින් යමක් එකතු කරන්න උත්සාහ කළා''.

ඉතින් ඔය විදියට බලාගෙන යනකොට අප්‍රේල් මාසේ 30 වැනිදා එළිදක්වන්න සූදානම් කරන සිරිනි දිසානායක දුවගේ ''සිනාවී'' සංගත තැටියෙත්, ඒ ප්‍රසංගයේත් ඇති වටිනාකම මේ ගැන හිතන අයට වැටහෙනවා ඇති. මේ දේවල් කරන, කරන්න කැමති දූ දරුවන්ටත් මේ වගේ දෙයක් පෙන්වන එක වටිනවා. තමන්ටත් මේ වාගේ දේ කරන්න පුළුවන් බව අඟවන්නවත් තරුණ දූ දරුවන් කීපදෙනෙකුටත් වේදිකාව විවෘතයි. වේදිකාවේ ගායනා කරන්න වැඩිය ඉඩකඩ නොලැබෙන දරුවන් කීප දෙනෙකුට හරි ඒ ඉඩ වෙන් කරන්න ඇත්තේ අර වගකීමත්, යුතුකමත් තේරුම් ගත්ත හන්දා වෙන්න ඕන. රසික ප්‍රේක්ෂකයින් හැටියටත් ඒ වගකීම, යුතුකම ඉෂ්ට වෙන්නෙ මොන තරමින්ද කියන දේ බලා ගන්න වෙන්නෙ නම් අප්‍රේල් 30 දා හවස තමයි ඉතින්'' පන් කිව්වා.






මහත්තයා ගාව තියෙනවා. ''කැරොකේ'' ක්‍රමයටයි මේ දේවල් කෙරෙන්නේ.

''මේ වගේ තැන්වලට ආවම සිත නිදහස්'' තරගයක් නෑ. කවුරුත් තමන්ට පුළුවන් හැටියට කියනවා. වැරදුණාට හිනා වෙන්න කෙනෙක් නෑ. සමගියත් තියෙනවා'' පන් තමන්ට දැනුන දේ කිව්වා.

''ඇත්ත. විනෝද වෙන්න නම් මුලින්ම හිත නිදහස් වෙන් ඕන. ඒත් ඉතින් ගායන හැකියාවත් වැඩි දියුණු කරගන්න පුළුවන්නම් තමයි හොඳ''. පැන් අදහසක් එක් කළා.

''ඒක ඉබේටම වෙනවානේ. මාසයක් ගානේ මෙහෙට එකතු වෙලා සින්දු කියන එක තමන් තනියම නානකොට, වෙන වැඩක් කරන ගමන් කියනවා වගේ නෙවෙයි. මමනම් වැරදුන සින්දු ආයෙ ආයෙ කියනවා. හොඳට කියන අයගෙන් අඩුපාඩු අහගන්න පුළුවන. කපිල මහත්තයා හැම මාසෙම වීඩියෝ කරන නිසා තමන්ගේ ඉදිරිපත් කිරීම කොහොමද කියලා බලලා වැරදි හදාගත්ත හැකි. අනික සබකෝලෙත් අඩුවෙනවා''

''මට නම් සේරටම වැඩිය වටින්නේ අපේ දෙවෙනි පරම්පරාවේ දරුවෝ මේ වෙනවා. ඒ අතින් ඉසුරු පුතාලා වගේ අපේ දරුවෝ මේ දේවල් කරන එකත්, ලැජ්ජා නොවී ඉදිරිපත් වෙන එකත් අගේ කරන්න ඕන. ''පන් ලියවිල්ලක ලියන්න තියන ඡේදයක්ම හිතට ආව විදියට කිව්වා''.

''සංගීතය, ගණිතයට සම්බන්ධය කියලා විද්‍යාවෙන් කියනවානේ''. පැන් හදිස්සියේ මතක් වුණා වගේ ඌනපූර්ණයක් කළා.

''මේ රටේ අපේ දරුවෝ සංගත තැටි පවා එළි දක්වලා තියෙනවා. මුලින්ම සමන්ත වීරරත්න තරුණයා. ඊට පස්සේ අසුන්තා කරුණාරත්න දුව. කාංචනා සඳමාලි, මිලන් රූපසිංහ. මේ අය මෙල්බන් නුවරින්. සිඩ්නි නුවරින් තිසල් වංසජ පාදුක්ක විදාන දරුවත් එකතු වෙනවා මේ ගොන්නට. සංගත තැටි කළේ නැතත් මහීෂ ගමගේ, අශ්විනී දහනායක, හසිනි ඉළංගරත්න, සචිනි වීරකෝන් වගේ අය තමන්ගේ ස්වතන්ත්‍ර ගීත එක, දෙක කරලා තියෙනවා. එහෙම නැතත් ඉසුරු, මනීෂා ජයකොඩි, වාගේ ගායනයට දක්ෂ දරුවෝ මේ වගේ තැන්වලදී, සිංහල භාෂා පාසල්වල විවිධ ප්‍රසංග වලදී අපි දකිනවා. මනීෂාත් ''මියුරු සර'' ගායනා කවයේ සින්දු කියන විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක්''.

''මියුරු සර'' ගායන එකතුව සංවිධානය කරන්නේ ඩඩ්ලි - ලලිතා විමලතිස්ස දෙපලයි.

අති දක්ෂ කැරවෑන් සාදන්නෙක් අවශ්‍යයි
කැරවෑන් සැලසුම් මොඩල් සහ සෑදීම පිලිබඳ
මනා දැනුමක් පළපුරුද්දක් ඇති අය
කරුණාකර

අමතන්න
**සමන් 0490 104 398**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com